# සංක්ෂිප්තය

මෙරට අධ්‍යාපන පද්ධතිය තුළ සම්පත් බෙදී යාමේ අසමානත්වය මෙන්ම ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමට අවශ්‍ය සම්පත් ඌණතා ද හඳුනා ගෙන දෙවන සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය (2003) අරඹන ලදී. ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා ගුණාත්මක යෙදවුම් නිසි පරිදි භාවිත වන්නේ ද? එමෙන්ම එම ගුණාත්මක යෙදවුම් පාසල් මට්ටමින් භාවිතයට ගැනීමේ දී පැන නගින ගැටලු හඳුනා ගැනීම ද වර්තමානයේ අධ්‍යාපන පද්ධතියේ ප්‍රගතිය උදෙසා අවශ්‍ය කාර්යයක් බවට පත්ව ඇත. එහෙයින් මෙම පර්යේෂණ නිබන්ධනයේදී ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ගුණාත්මක යෙදවුම් කළමනාකරණය හා ඒ සම්බන්ධ ගැටලු අධ්‍යයනයට බඳුන් කර ඇත.

මෙම අධ්‍යයනය දියත් කිරීම සඳහා

- රජයේ පාසල් සඳහා ලබා ගන්නා ගුණාත්මක යෙදවුම්වල ස්වභාවය හඳුනා ගැනීම
- රජයේ පාසල් සඳහා ලබා ගන්නා ගුණාත්මක යෙදවුම් කළමනාකරණය කරනු ලබන ආකාරය ආකාරය හඳුනා ගැනීම
- රජයේ පාසල් සඳහා ලබා ගන්නා ගුණාත්මක යෙදවුම් කළමනාකරණය සම්බන්ධව ඇති ගැටලු හඳුනා ගැනීම
- රජයේ පාසල් සඳහා ලබා ගන්නා ගුණාත්මක යෙදවුම් කළමනාකරණය හා ඒ සම්බන්ධව ඇති ගැටලුවලට විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීම

යන සුවිශේෂී අරමුණු දායක කර ගන්නා ලදී. ඉහත අරමුණුවලට අදාළ ව පර්යේෂණ නිබන්ධනය තුළ දත්ත විශ්ලේෂණය සිදු කර ඇත.

ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ගුණාත්මක යෙදවුම් කළමනාකරණය හා ඒ සම්බන්ධ ගැටලු පිළිබඳ සිදු කළ මෙම අධ්‍යයනය සඳහා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සමීක්ෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදී. ඒ සඳහා ඉලක්ක ජනගහනය ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනය අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍ය 1AB, 1C, 2 වර්ගය හා 3 වර්ගයේ පාසල් පහක් යොදා ගන්නා ලදී. අධ්‍යයනයට අදාළ දත්ත ලබා ගැනීම සඳහා නියැදියට අයත් පාසල්වල විදුහල්පතිවරුන් පස් දෙනා ද ගුරුවරුන් 50 දෙනෙකු ද පාසල් ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් 20 දෙනෙකු ද තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් 15 දෙනෙකු ද යොදා ගන්නා ලදී. ඉහත නියැදීන්ට අදාළ ව ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා නියමාවලි, නිරීක්ෂණ හා ලිඛිත මූලාශ්‍ර සමීක්ෂණ යන පර්යේෂණ උපකරණ ඔස්සේ ලබා ගත් තොරතුරු විස්තරාත්මක සහ සරල සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම උපයෝගී කර ගනිමින් විශ්ලේෂණය කරනු ලැබීය.

මෙම අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය, අධ්‍යයනයේ එක් එක් අරමුණු ඔස්සේ සිදු කරන ලදී. එහිදී ගුණාත්මක යෙදවුම් ක්‍රියාවලිය පිළිබඳ නියැදියට අයත් සියලුම විදුහල්පතිවරුන් දැනුවත්භාවයකින් යුක්ත බව අනාවරණය විය. එමෙන්ම ගුරුවරුන්ගෙන් බහුතරයක් ගුණාත්මක යෙදවුම් ක්‍රියාවලිය පිළිබඳ දැනුවත්භාවයක් ලබා ඇති නමුත් ගුරුවරුන්ගෙන් සුළු පිරිසකට දැනුවත්භාවයක් නොමැති බව දක්නට ලැබිණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ගුණාත්මක යෙදවුම් යොදා ගන්නා ආකාරය විමර්ශනයේදී ගුරුවරුන්ගෙන් බහුතරයක් නියමිත දිනට අවශ්‍යතා ලේඛන ඉදිරිපත් නොකරන බව අනාවරණය විය. එමෙන්ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ප්‍රායෝගිකව ගුණාත්මක යෙදවුම් භාවිතය මධ්‍යස්ථ මට්ටමක පවතී. අවශ්‍යතා ලේඛන නියමිත කාල සීමාව ඇතුළත නොලැබීම ගුණාත්මක යෙදවුම් භාවිතය පිළිබඳ ඇති වී තිබෙන ප්‍රධාන ගැටලුවක් ලෙස හඳුනා ගත හැකිය. එසේම ගුණාත්මක යෙදවුම් පිළිබඳ පත් කර ඇති කමිටු සක්‍රිය ලෙස ක්‍රියාත්මක නොවීම ද ප්‍රබල ගැටලුවක් වී ඇත. මෙම ගැටලු සහගත තත්ත්වයන් අවම කිරීමට පාසල් විසින් විවිධ විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි.

මේ අනුව ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ගුණාත්මක යෙදවුම් කළමනාකරණය හා ඒ සම්බන්ධ ගැටලු පිළිබඳ සිදු කළ මෙම අධ්‍යයනයේ දී විවිධ ගැටලු සහගත තත්ත්වයන් පවතින බව අනාවරණය විය. එම ගැටලු සහගත තත්ත්වයන් අවම කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති අතර එය ගුණාත්මක යෙදවුම් සංරචකය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට ඉවහල් වනු ඇත.